// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,127 - 2019 ජූනි මස 07 වැනි සිකුරාදා - 2019.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 352 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 354 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 ජූනි මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූනි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය.

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
අංක 236, ගාලු පාර, කොළඹ 03.

...............................*පැමිණිලිකරු.*

නඩු අංක : CHC/346/14MR

*එදිරිව*

ගුරුන්නාන්සේලාගේ දොන් පාලිත සිරිලාල්,
98/M/48, සෙනික් වීව්,
කහන්තොට පාර, මාලඹේ.

.....................................*විත්තිකරු.*

නිහාල් බෙනිටෝ ලෝගුස් ප්‍රනාන්දු,
276/1, මීගමුව පාර, වත්තල.

.................*එකතුකළ විත්තිකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙතය.

වර්ෂ 2018 ක් වූ මාර්තු මස 08 වන දින ඇතුළත් කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ඉහත නම් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට, රු. 5,424,945.18 ක මුදල සහ 2014.01.06 වන දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් ප්‍රධාන ණය මුදල මත වසරකට 32% ක් බැගින් වූ පොළියක් ද හිඟ තබන ලද වාරික මත 5% ක දඩ පොළිය සහ වෙනත් වියදම් ගෙවීමටත් විත්තිකරු එකඟ වී ඇති හෙයින් ද, රු. 11,120,155.21 ක මුදල සහ 2014.01.06 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් ප්‍රධාන ණය මුදල මත වසරකට 30% ක් බැගින් වූ පොළියක්ද හිඟ තබන ලද වාරික මත 5% ක දඩ පොළිය සහ වෙනත් වියදම් ගෙවිය යුතු බවත්, සියලුම අයකිරීම් තීන්දු ප්‍රකාශයේ දින සිට මාස 02 ක් තුළදී හෝ එකී තීන්දු ප්‍රකාශයේ අධිකරණය විසින් නියම කරන ඊට වඩා දීර්ඝ කාලයකදී ගෙවීම පැහැර හරින්නේ නම් මෙහි පහත උපලේඛනයේ විස්තර වන හා වර්ෂ 2013.01.07 සහ 2013.04.11 වන දින ලියා සහතික කරන ලද අංක 694 සහ 771 දරන උකස් බැඳුම්කර යටතේ ඇප වශයෙන් තබා ඇති එකී ඉඩම හා ඊට අදාළ දේපළ අධිකරණය විසින් පත් කරන බලයලත් වෙන්දේසිකරුවකු ලවා අධිකරණය විසින් අනුමත කරන විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසිකරුවකු ලවා විකිණීමට විත්තිය එකගව ඇති හෙයින් ද, තව ද, විත්තිකරු විසින් පැමිණිලිකරුට අධිකරණයේ නිලධාරියකු විසින් තක්සේරු කරන ලද නඩු ගාස්තු ගෙවිය යුතු බවටත් එකඟ වී ඇති හෙයින් ද, එසේ වුවද, විත්තිකරු විසින් රු. 27,100,000 ක මුදලක් පහත සඳහන් පරිදි පැමිණිලිකරු වෙත ගෙවා නිම කරන්නේ නම් විත්තිකරුට විරුද්ධව ඇති තීන්දු ප්‍රකාශය ඉටු කළාසේ සැලකීමට පැමිණිලිකාර සමාගම එකගව ඇති බැවින් ද, ඒ අනුව විත්තිකරු විසින් ඉහත කී රු. 27,100,000 මුදල වර්ෂ 2018 ක් වූ මාර්තු මස 25 වන දිනෙන් පටන් ගෙන මාස 48 ක් තුළ එනම් වර්ෂ 2022 ක් වූ පෙබරවාරි මස 25 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ආකාරයට පැමිණිලිකරු වෙත ගෙවීමට එකගව ඇති බැවින් ද,

(i) 2018.09.25, 2019.09.25, 2020.09.25 සහ 2021.09.25 යන මාසික වාරික හතර (04) මසකට රු. 5,000,000 ක් බැගින් ඉහත කී සෑම මසකම 25 වන දින හෝ ඊට පෙර ගෙවීමටත්,

(ii) ඉහත සඳහන් මාසික වාරික හතර (04) හැර 2018.03.25 වන දිනෙන් පටන් ගෙන 2022.02.25 දක්වා වූ ඉතිරි මාසික වාරික 44 මසකට රු. 100,000 ක් බැගින් වූ අවම මාසික වාරිකවලින් සෑම මසකම 25 වන දින හෝ ඊට පෙර ගෙවීමටත්,

(iii) ඉහත කී රු. 27,100,000 ක මුදල 2022.02.25 වන දින හෝ ඊට පෙර පැමිණිලිකරු වෙත ගෙවීමටත් විත්තිකරු එකගව ඇති බැවින් ද,

විත්තිකරු විසින් ඉහත කී රු. 100,000 ක් බැගින් වූ අවම මාසික වාරික 3 ක් (පිට පිට නොවේ) සහ/හෝ රු. 5,000,000 ක් බැගින් වූ මාසික වාරික එකක් ගෙවීම පැහැර හැරියහොත් සහ/හෝ සම්පූර්ණ මුදල වන රු. 27,100,000 ක මුදල 2022 ක් වූ පෙබරවාරි මස 25 වන දින හෝ ඊට පෙර ගෙවීම පැහැර හැරියහොත් අවුරුද්දක් ගත වුවද විත්තිකරුට නොතීසි නොමැතිව මෙම සමථය ප්‍රකාර මුදලින් ඒ වන විට වො ඇති මුදලක් වේ නම් එකී මුදල සම්පූර්ණ තීන්දු ප්‍රකාශිත මුදලින් අඩුකොට තීන්දු, ප්‍රකාශිත ඉතිරි මුදල අයකර ගැනීම සඳහා පැමිණිල්ලේ උපලේඛනගත දේපළ 1949 අංක 06 දරන උකස් පනතේ ප්‍රතිපාදන අනුව සහ පැමිණිල්ලේ ආයාචනයේ සඳහන් පරිදි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට පැමිණිළිකරුට අයිතියක් ඇති බවටත්, එසේ අදාළ ඉඩම වෙන්දේසි කිරීමට සිදුවුවහොත් වෙන්දේසි ගාස්තු ගෙවීමට ද විත්තිකරු එකඟව ඇති බවට ද නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තව ද, සමථය ප්‍රකාරව නිසි පරිදි මුදල් ගෙවා අවසන් වුවහොත් පැමිණිල්ලේ උපලේඛනගත දේපළට අදාළව ලියාපදිංචි කර ඇති ලිස්පෙන්ඩනය අවලංගු කිරීමටත්, මෙම නඩුවට විෂයගත අංක 694 සහ 771 දරන උකස්කරයන් අවලංගු කර නැවත භාරදීමට සහ පැමිණිලිකරු භාරයේ ඇති ඉහත කී ඉඩමට අදාළ මුල් ලේඛන විත්තිකරු වෙත නිදහස් කිරීමට පැමිණිලිකරු එකඟ වූ බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද, ඒ අනුව විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශයෙන් පසුව රු. 200,000 ක මුදලක් පමණක් ගෙවා ඉතිරි මුදල් ගෙවීම විත්තිකරු විසින් අපොහොසත් වී සහ පැහැර හැර ඇති බැවින්, ඒ අනුව විත්තිකරුට අයත් චංචල සහ නිශ්චල දේපළ වත්කම් බැරකම් සහ ලැබීම් තහනම් කර බලය පවරනු ලැබ ඇති හෙයින් ද මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ, වර්ෂ 2019 ක් වූ ජූලි මස 10 වන දින ප.ව. 2.00 ට එකී දේපළ පිහිටා ඇති කඩවත, නුවර පාර, අංක 288 දරන ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

*දේපළට පිවිසීම.*- කිරිබත්ගොඩ නගරයේ සිට මහර හන්දියට පැමිණ, මහර හන්දියේ සිට නුවර දෙසට මීටර් 500 ක් ගිය පසු දකුණු පස අංක 288 දරන ස්ථානයේ පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසියේදී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

i. මුල් ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
ii. තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
iii. වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් අදාළ මුදල, මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම් ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ, මැදපත්තුවේ සියනෑ කෝරළේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහළ බියන්විල පිහිටි ඕකුරුන්දුවත්ත සහ කැටකැලගහවත්ත යන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ මහතාගේ අංක 330/1985 සහ 1985.12.30 දිනැති පිඹුරේ ලොට් අංක 9 දරන කොටසට මායිම් උතුරු- නැගෙනහිරට : කැබලි අංක 10 ද, දකුණු නැගෙනහිරට : කැබලි අංක 8 ද, දකුණු - බටහිරට : කැබලි අංක 8 ද සහ උතුරු - බස්නාහිරට නුවර පාර ද යන මායිම් වූ තුළ පිහිටි පර්චස් විසිපහයි දශම තුනයි එකක් (අ. 0, රූ.0, පර්. 25.31) ක් *හෙවත්* හෙක්ටයාර් 0.0640 විශාල ඉඩම සහ ඊට අයත් සෑම සියලු දේත් සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N11/51 හි ලියාපදිංචි වී ඇත.

බී. ජේ. එෆ්. ද සිල්වා,
අධිකරණ රෙජිස්ට්‍රාර්,
නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු.

වාණිජ මහාධිකරණය, කොළඹ 12.
වර්ෂ 2019 ක් වූ මැයි මස 29 වැනි දින.

06-301

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

### ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

හලාවත (61000) සිංහපුර පාර, අංක 53B දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, කිං ඇක්වා සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි කාරණාව සම්බන්ධවයි.

*නඩු අංක* : 15/2019/CO.
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන කොටස ප්‍රකාරව සහ ඊට යටත්ව ගරු අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම පිළිබඳ කාරණාව සම්බන්ධවයි.

ගෝල්ඩ් කොයින් ස්පෙෂලිටීස් එස්ඩීඑන් බීඑච්ඩී
19, ජලාන් පෙරිගි නිනාස්, 7/2, කේඑස් 11,
කවාසන් පෙරින්ඩුස්ට්‍රේන් පුලෝ ඉන්ඩාර්,
42920, පූලෝ ඉන්ඩාර්, සීලන්ගෝර්,
මලයාසියාව.

.................................*පෙත්සම්කරු.*

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා මලයාසියාව, සීලන්ගෝර්, 42920, පූලෝ ඉන්ඩාර්, කවාසන් පෙරින්ඩුස්ට්‍රේන් පුලෝ ඉන්ඩාර්, කේඑස් 11, 7/2, ජලාන් රිගි නිනාස්, 19හි පිහිටි ගෝල්ඩ් කොයින් ස්පෙෂලිටීස් එස්ඩීඑන් බීඑච්ඩී විසින් 2019 ක් වූ මාර්තු මස 29 වැනි දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2019 ක්වූ ජුනි මස 25 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරන ලබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහාය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

අත්සන් කළේ :- එෆ්. ජේ. සහ ජී. ද සේරම්,
නීතිඥවරු,
අංක 216, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

*සටහන :* එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් එෆ්. ජේ. සහ ජී. ද සේරම් නීතිඥ මහතුන්ට ලිඛිතව දන්වා බාරදිය යුතුය. *නැතහොත්,* තැපෑලෙන් එවිය යුතුය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, 2019ක්වූ ජුනි මස 24 වැනි දින පස්වරු 6.00ට පෙර බාරදිය යුතු ය. *නැතහොත්,* තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරුන්ට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතුය.

06-138

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | *රු.* | *ශ.* |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට | ... | ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට | ... | ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019** වර්ෂය | | | |
| ජූනි | 2019.06.07 | සිකුරාදා | 2019.05.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.14 | සිකුරාදා | 2019.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.21 | සිකුරාදා | 2019.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.06.28 | සිකුරාදා | 2019.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2019.07.05 | සිකුරාදා | 2019.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.12 | සිකුරාදා | 2019.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.19 | සිකුරාදා | 2019.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.07.26 | සිකුරාදා | 2019.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2019.08.02 | සිකුරාදා | 2019.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.09 | සිකුරාදා | 2019.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.16 | සිකුරාදා | 2019.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.23 | සිකුරාදා | 2019.08.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.08.30 | සිකුරාදා | 2019.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.